# යළි උපන්නෙමි



පී.එච්.ඒ.එන්. සමන්මලී




ප්‍රථම මුද්‍රණය - 2021.01.15

දෙවන මුද්‍රණය - 2023.11.11

(සංශෝධන සහිත)

කතාව - ජී.එච්.ඒ.එන්. සමන්මලී

පිටකවරයේ චිත්‍ර - අමූර්තා ගොඩගේ

ඇතුළත චිත්‍රය - සෙනුලි රෂ්විතා මෙනන්

කර්තෘ ප්‍රකාශයකි.

ISBN අංකය - 978-624-206-555-7

මුද්‍රණය

**'The PRESS'**

කොටුගොඩැල්ල වීදිය,

මහනුවර

# පිදුම

හිමිදිරි උදෑසනක පිපි
කෝපි මලක් තුලින් විශ්වයේ සුන්දරත්වය දකින්නටත්
කුරුලු ගීතයක් සේ සැහැල්ලු ව
ජීවිතය ගයා යන්නටත්,
දිවි මගේ හමුවන සැමගේ,
සොඳුරු යහගුණ අගයමින්,
සතුටින් ම හිඳින්නටත්, ළතෙත් හිතක්,
ඇතිව මා වැඩූ,
දෙව් ලොව සිට නිරතුරු මා රකිනා
ආදරණීය මෑණියන්ටත් පියාණන්ටත්
හමු වූ දින සිට ම දයාබර හිතැති ව
සෙනෙහස දෙන,
දිවිමඟ,
සොඳුරු ම ගීයට අත්වැල වූ,
එරන්ද ඒකනායක, මාගේ ආදරණීය සැමියාටත්,
කුසහොත් දින පටන් ම
මාගේ හුස්මට මිහිරියාව ම වඩන,
මා පණ වන් සෙතුම් පුතුටත්,
මා ගුරු දිවිය තුටු කළ,
සුවහසක් දරු කැළටත්,
දිරියෙන් ම ගුරු අම්මාවක වන්නට තරම් සෙනෙහසින් ළඟ හිඳින,
සොඳුරු මහාමායාවේ 4 B (2019/3c 2020/4B 2023 පන්තිවල මගේ
ආදරණීය දියණිවරුන්ටත්,
**''යළි උපන්නෙමි''**
තුටු සිතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනන ''විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ ''දිවිය දිනන විද්‍යුත් පොතක්''ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක

ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක් වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023-11-01

# ස්තූතිය...

පොතක් නම් කවර අරුමයක්ද?

දිවියේ අරුමැසි මතක මුවින් කියනු මිස...

මේ පුංචි රස මතක ලියන්නට යැයි කියා

දිරිය දුන් අය මේය..

අකුරු ගැළපූ දා පටන් හොඳ ම දෑ නිමවන්නට කියා දුන්, මගේ ගුරු

දෙව් සැමට

ගුරු දිවිය සුවඳවත් කරමින් යළි උපන්නට,

මා හට එළිය දුන්, ඒ වෙනුවෙන් ලියූ නිබන්දනය,

පොතක් කරනට තරම්... අද දිනට සවිය දුන්

මහනුවර මහ රෝහලේ ''නිවහන'' මනෝ සමාජයීය උපදේශන

ඒකකයේ සහතිකපත්‍ර පාඨමාලාවට

ජීවය දුන් ඇදුරු මඩුල්ලට,

එහි හමුවූ අදටත් මා සමග මිතුරු අපූරු යහළු යෙහෙළියන්ට,

ලියූ පොත් ඇති යැයි කියා නොලියා සිටින විට,

තව පොතක් ලියන්නට ම ලියන්නට ම කියා ලියන තෙක් ම

මා දිරිමත් කළ,

සංවේදී හිත, මහාමායාවේ රංජනී සෙන්දනායක

ගුරු අම්මාට...

නුවර අහස යට හමුවන, අපූරු දෑ තනන

සියලු සොඳුරු හිත්වලට,

ගුරු දිවියේ, හමු වූ දයාර්ද හිත් හිමි මහාමායාවේ,

ඉවසිලිවන්ත විදුහල්පති නියමුවන් දෙපළට

සහ සෙනහැති ආදරණීය මහාමායාවේ ගුරු සොයුරු සොයුරියන්

සැමට,

දරුවන්ට පොත් ලියන්නට කියා

ලේඛක අංකුර මැවූ, දයාබර පොත් Sir,

සෙනෙවිරත්න ගුරු මහතාට,

පිටකවරයේ චිත්‍රය සකසා දුන් මහාමායාවේ

ආදි ශිෂ්‍යා අමුර්තා ගොඩගේ දියණියට...

ඇතුළත චිත්‍රය ඇද දුන් මහාමායාවේ 5B පන්තියේ

සෙනුලි රෂ්විතා මෙනන් දියණියට....

දූවරුන්ගේ සෙනෙහස මට දෙන මගේ මහාමායා දියණිවරුන්ට

බොහෝ දේ ලියන්නට කියවන්නට කාලය වෙන් කර දෙන ආදරණීය

සැමියාට සහ ආදරණීය සෙතුම් පුතණුවන්ට

මගේ සෙනෙහසේ ප්‍රණාමය හිමිවිය යුතුම ය.



**මතක සුවඳ**
**(කතෘගේ සටහන)**

“දිවිය දිනන **විද්‍යුත්** පොතක්” - 2023 **ව්‍යාපෘතිය** වෙනුවෙන් **ග්‍රන්ථ** රචනා කරන මහනුවර මහාමායා බාලිකාවේ කුඩා දියණිවරුන්ට ආදර්ශයක් ලෙස ගුරු දිවියේ ලද අත්දැකීම් ඇසුරෙන් ලියූ යළි උපන්නෙමි නම් වූ මෙම කෘතිය නව සංස්කරණයක් ලෙස සකස් කරන ලදී .

**ව්‍යාපෘතිය** වෙනුවෙන් **ග්‍රන්ථ** රචනාකළ ලංකාවාසී සියලු පාසල් දරුවන්ගේ ලේඛන හැකියාවන් අද වන විට **ජාත්‍යන්තරය** වෙත ගෙනයාම දක්වා මෙහි නිර්මාතෘ සෙනවිරත්න **මහලේකම්ගේ** ගුරුතුමා සමඟ එක් ව අප පාසල විසින් විවිධ **ව්‍යාපෘති** හඳුන්වා දෙන ලදී .

එතුමා විසින් ගත්කරණී **මධ්‍යම** පළාතේ පාසල් දරුවන් 5000ක් පමණ පොත් රචනා කිරීමට යොමු කිරීම, කොවිඩ් නිවාඩු සමයේ,පාසල් දරුවන් 50000 කටත් වඩා පොත්, රචනා කළ අකුරු කරන නිවාඩුවෙන් රටක් වටින පොතක්,ලංකාවේ සියලු පාසල් දරුවන්ට විවෘත වූ **ව්‍යාපෘතිය** (2020) සහ මහාමායා පන්හිඳෙන් දළදා උපහාර (2021 ජනවාරි 15) **ශ්‍රී** සම්බුද්ධත්ව ජයන්තියෙන් වසර 2564 ක් ගතවීම සිහිකොට මහාමායා දියණිවරුන් **ප්‍රමුඛ** පාසල් **ප්‍රජාව** විසින් පොත් 2564 ක් නිමවා දළදා සමිඳුන් වෙත පූජාකිරීමේ **ව්‍යාපෘතිය** අති සාර්ථක ව නිමකරන ලදී. මෙම **ව්‍යාපෘති** සියල්ලට ම පාසල වෙනුවෙන් **ක්‍රියාකාරීව** ව සම්බන්ධ වීමේ අවස්ථාව මට ද හිමිවීම සතුටකි.

පාසල මූලිකත්වයෙන් ගන්නා මෙම නවත ම උත්සාහය දිවිය දිනින **විද්‍යුත්** පොතක් - 2023 **ව්‍යාපෘතියේ** මහාමායා බාලිකා විදුහලේ **ප්‍රාථමික** අංශයේ ආචාර්යවරියක ලෙස මෙහි **ව්‍යාපෘති** සම්බන්ධීකාරකවරිය වශයෙන් **විද්‍යාලයේ** ඇදුරු මඩුල්ල සමඟ එක් ව කුඩා දරුවන් ,හයසීයකටත් වඩා පිරිසක් **විද්‍යුත්** පොත් රචනා කිරීමට යොමු කිරීමට ලැබීම ගුරුදිවියේ ලද **භාග්‍යයක්** කොට සලකමි.

ශ්‍රී ලංකාවේ පාසලක් විසින් මෙවැනි **විද්‍යුත්** පොත් රචනා කිරීමේ **ව්‍යාපෘතියකට** යොමුවූ පළමු අවස්ථාව මෙයයි.

(තවත් සංවේදී කතාවක් ඇත නොකියා ම බැරි.) මා අතැර මගේ ආදරණීය මෑණියන් දෙව්ලොව ගොස් වසරක් ඉක්ම ගොස් ය.. මෑණියන්ගේ වියෝවෙන් තුන් මසක් පිරෙන දා මහගෙදර අස්පස් කරද්දී ඈ සතුව පැවති ඇඳුම් අල්මාරියෙන්, අප කුඩා කල ඇඳි ස්මෝක් කළ සිඟිති ඇඳුම් කිහිපයක් තුළ ඔතා තිබූ .. මා තුන **ශ්‍රේණියේ** කුඩා සිසුවියක ව සිටිය දී ගෙතූ පළමු කතාන්දරය ලියූ කහ පැහැ ගැහුණු කොළ කිහිපය හමු වූ හද කම්පා කරන සිදුවීම නොවන්නට...

දිවිය දිනන **විද්‍යුත්** පොතක් **ව්‍යාපෘතිය** වෙනුවෙන් පාසලේ දූවරුන්ගේ සහභාගීත්වය තහවුරු කරනු පිණිස.. **දැඩි ඉවසීමෙන් මා සතු** සියලු ශක්තීන් වැය කරන්නට මා හට නොසිතෙන්නට ද පුළුවන ..අද මගේ පාසලේ කුඩා දූවරුන් සිය ගණනක් කතෘ නාමයෙන් පිදුම් ලබද්දී,දූවරුන්ගේ දෙමවුපියන් ගේ ඇස්වල රැඳි සතුටු කඳුළු දකින විට ,

එදා ඒ පත් කියවා මගේ මැණියන් කොපමණ සතුටක් ලබන්නට ඇත් දැයි මට දැනෙයි. පුරා වසර 34ක් ආදරය සමඟ ඒ පත්තිරු සඟවා තබාගත් මගේ ආදරණීය මැණියන් නමට , මා කුඩා කල බුහුටියට කතා ගොතද්දී හූ මිටි තබමින් බලා සිට, ඉඩක් ලද සෑම විට ම කතන්දර පොත් රැසක් ගෙනැවිත් මා අසල තැබූ ආදරණීය
මා පියාණන් නමට.. මේ උත්සාහයේ දී මා ලද පිනක් වේ නම් අනුමෝදන් වේවායි **ප්‍රාර්ථනා** කරමි.

දයාබර දරුවනි,

පොත පත කියවන්නට, ලියන්නට,අලුතින් හිතන්නට,හෘදය සංවේදී වන්නට ,එකිනෙකා කෙරෙහි මානව දයා සිතුවිලි ඇති කරගන්නට, ඔබේ නිර්මාණශීලී සිතුවිලි හෙට දවසේ යොමුවුවහොත්..මෙකී උත්සාහයෙන් අප ලබන අග්‍ර පලය එයයි.
ඔබ සැමට දළදා සමිඳු පිහිටයි.

ජී.එච්.ඒ. එන්.සමන්මලී මිය.
"දිවිය දිනන **විද්‍යුත්** පොතක්"
**ව්‍යාපෘති** සම්බන්ධීකාරිකා.
මහාමායා බාලිකා විදුහල,
**(ප්‍රාථමික** අංශය),
මහනුවර

# යළි උපන්නෙමි.

සැඩ සුළඟ විඳ මහමෙරක් ලෙස
නොබිය නොසැලිව දරා හිදිමින
මඳ පවන වැද ළදල්ලක් ලෙස
හඬයි වාවනු නොහැකි වූ විට

රුදුරු අවි ගෙන පැමිණි රුපුදන
දෑල අවුරා සිටින සඳ වුව
සෙවූ එලවැල නෙළා ගෙන මිස
නැවත නොහැරෙමි පරාජිත ලෙස

තියුණු කටු මැද ඇණී නොමියෙන
මලක් සේ මලසුනක පුද දෙන
ගසක් ලෙස මිහි ගැබින් මතු වන
බෙදයි සෙවණ ද සිසිල සමඟින

සසර ගංතෙර එහා ඉවුරට
මෙත් බුදුන් දැක එතෙර වන්නට
දැවෙන පුහුදුන් ලොවෙහි තනිවම
මසිත වඩවයි පාරමී ගුණ...

මම කවුද? අතීතයේ දවසක මහනුවර මහ රෝහල් පරිශ්‍රයේ පුස්තකාල ශ්‍රවනාගාරයේ දී උක්ත පැනයට කළින් කියවූ මතකයකින් උපුටා ගත් කවි පෙළින් උපුටා දක්වමින් සටහන ආරම්භ කරමි. සොබා දහමේ රිද්මයට ඉතසිතින් අවනත ව සියලු චිත්ත සමාපත්තීන් පින් පව් අතර කිරා මැන පින් ම වේ යැයි සිතන යමක් ඇත්නම් අනලස් ව නොපැකිළි ව කරන්නට සියලු සිතුවිලි මෙහෙයවමින් දිවි මගේ හමුවන සැමට කුමන අයුරකට හෝ යහපතක් ආශිර්වාදයක් වන්නට ම දිවි සැරිය ගයා යන පුංචි සිතකට තවත් දුර ගමනක් නොපැකිළි ව පා තබන්නට නැවතත් නියත විවරණ ලැබූ මොහොත... විඩා බර වූ මසිතට සොඳුරු නිවහනක් ම වූ නිවහන සමාජයේ මනෝ සමාජීය ඒකකයේ සහතිකපත්‍ර පාඨමාලාවට එක් වූ දිනය මට අද මෙන් මතකයට නැගේ. එවක් පටන් පුරා සිව් මසක කාලයක් සැම සඳුදා දිනක්ම අලුත් බලාපොරොත්තු මතින් සිනාසෙන දිනයක් ම වන්නට දයාබර ''නිවහන'' නුඹ මා හට යළි පාර කියා දුන්නෙහි ය.

සසරේ පුරුදු යහපත් මං මාවත් යන ගමන උදක් ම සසර දුකින් එතෙර වන්නට නිවන් මඟ ම සොයමින් මේ ලෞකික දිවියේ සියලු බැඳීම්වලින් මිදී යා නොහැකි ව අටලෝ දහමේ අභියෝගයන්ට මුහුණ දෙමින් රාජකාරිය දේවකාරියක් කර ගනිමින් උතුම් ගුරු මවක් ම වී පුංචි දූ දරුවන්ගේ ජීවිත ඒකාලෝක කරන්නේ මැයි යන තිර අධිටනින් නොපැකිළිව දිවි සැරිය ගයා යන මා හට පැමිණෙනා අනේකවිධ බාධක සන්සුන්ව දරන්නට ඒවා දිනන්නට ඔබ මහා පවුරක් වූවා මතකයි දයාබර ''නිවහන.''

තම සිත තමාටම පහනක් සේ දල්වමින් කිසි විටෙක නිවී යා නොදී පිරිත් ස්වරයෙන් ගැයෙන මහානුභාව සම්පන්න ආශිර්වාද සිතුවිලි දහසක් දූවා දරුවන්ගේ නැණ පහන් දල්වන්නට තිර අධිටනින්

පෙරට යද්දී... දිවි මගේ හමු වූ අලුත් නවාතැන සෙංකඩගල පුරවරය... පුරවරයට ම ආලෝකයක් වූ සොඳුරු තක්සලාව නන්නාඳුනන හිත් ආඩම්බරකාර මහනුවර, මහනුවරට පිවිස නොබෝ කලකින්ම සතුටුදායක දේ මෙන්ම හිත් රිදීම්, හිත් හැදීම්, ගෞරවය මෙන්ම බාධක ද මා උර මත දරන්නට සිදු විය. සොයා පැමිණි පෞද්ගලික දිවියේ සියලු සැප සම්පත් බිරිඳක, සුරතල් පුතණුවකගේ මවක මෙන් ලබද්දී දයාබර සැමියෙකුගේ රැකවරණයෙන් දිවිය තෙදවත් වෙද්දී රාජකාරි දිවියේ ගැටලු මතු වන්නට වන විවිධ හේතු කාරණා විවිධ අවස්ථාවල මතු වෙද්දී සිත් රිදවා ගෙන බලා සිටින අවස්ථාවක සොයා පැමිණි, සිතා පැමිණි ගුරු දිවියේ සාරාර්ථ සාධනය පමා වෙද්දී කුමට පැමිණියා දැයි සිතෙන තරමට කාලය ගෙවෙද්දී, මා හදවත අපූරු බව හැඳිනගත් මගෙන් ශිල්ප ලබන දයාබර දියණියකගේ මවක විසින් දුන් අයදුම්පත පුරවා අන්තිම මොහොතේ හෝ එවන්නට අන්තිම තප්පරයට හෝ ගොස් ඒ අපූරු නිවහනට ඇතුළු වන්නට මට සිතුණ. නිමේෂය අද මා සිහිපත් කරන්නේ ඉතා බැතිබරිනි.

මා රාජකාරි දිවියේ මෙන්ම පෞද්ගලික දිවියේ ද ජීවිතයේ සැබෑ සතුට සොයා ගොස් උදක්ම මරණය හෙට උදයේ යැයි සිතා මැදියම් රැය වන විටත් පින්කමක යෙදෙන්නට, කිසිවකුගේ හිත් නොරිදන්නට යහපත් දේම කරන්නට සිතා කටයුතු කළ අයෙක්මි. මම යහපත් ප්‍රශංසාවෙන් උදක්ම සතුටු වන්නටත් ගැටලුවක් මතු වෙද්දී හඬා වැළපෙන්නටත් පුරුදු වී සිටි මා අන්තිමේ දී සියලු බාධක ජය ගෙන මා ම දිනනා බව දැන උත්සාහය උපරිම සේ වැය කරද්දී, මාගේ කායික, මානසික සුවය මගෙන් ගිලිහී ගිය වාර අනන්ත ය.

සිතෙන දේ ඉතා යහපත් නම්, ප්‍රශංසාවත්, නින්දාවත් එක සේ දරමින් තම වපසරිය තුළ තමාට කළ හැකි දේ පමණක් අරඹන්නටත්

සිත, කය, වචනය සමාධිගත කරගෙන සියලු යහපත් දේ කරන්නටත්, පෙරළා කිසිත් ලාභයක් නොතකා යහපතක් ම කරන්නටත් පෞරුෂයීය වශයෙන් මා හට අඩිතාලම සැකසුණේ නිවහනට ගොඩ වී මඳ කලක් යද්දී ය. මිනිසුන් යහපත් ලෙස වෙනස් කිරීමට මට හැකිය. මා ඉපදී ඇත්තේ ඒ වෙනුවෙන් ම යැයි සිතමින් කටයුතු කර ඒ උත්සහය සියයට සියයක් ම සාර්ථක විය යුතු යැයි මා දැන් සිතන්නේ නැත. මා උත්සහ කරනවා පමණි. වෙසෙසින් ම කුඩා දියණිවරුන් පනහකට ආසන්න සංඛ්‍යාවක් සෑම වසරක ම මාගේ භාරයේ හැදී වැඩෙන අතර, ඔවුන්ගේ ළමා අවධියේ හැසිරීම් දැක තවත් අවුරුදු විස්සකින් පමණ ඔවුන් ලොකු දැඩි වද්දී සිටිය යුත්තේ කෙසේද? කුමන සමාජයකද? ඔවුන්ගේ සිතුවිලි වෙනස් විය යුත්තේ කෙසේ ද? යැයි සිතමින් වෙනස් වන ලෝකයේ අභියෝගයන්ට මුහුණදිය හැකි අනාගත ශ්‍රමිකයින් පිරිසක් ගොඩනගන්නට නැණ පමණක් නොව රුවත් ගුණත් සමබරව දකින මානව හිතකාමී, පරිසර හිතකාමී මිනිස්කම හඳුනන පෞරුෂවත් අනාගත පරපුරක් ගොඩනැගීමට, ගුරුවරියක ලෙස මා සතු කාර්යභාරය කුමක් දැයි තදින් සිතන ඒ දිගු ඉලක්කය සපුරාගන්නට මෙකී උපදේශනයේ පාඨමාලාවේදී මඟ පෙන්වීම් ලැබුණි. විවිධ මනෝ උපදේශන ඉගැන්වීම් ඔස්සේ උගත් දේශන වල මූලික හරය තුළ දරුවන්ගේ ගැටලු බාධක හදුනා ගැනීමටත් ඒවාට පිළිතුරු සෙවීමටත් මා හට පහසුවක් විය.

වෙසෙසින් ම දරුවන්ට දැඩිව සෙනෙහස දෙන ගුරු මවක් ලෙස මාගේ පෞරුෂයේ තිබූ යම් යම් දුබලතා, ප්‍රබලතා හොඳින් හැඳින සිත් පීඩා හැඬුමකින් කෙලවර නොකොට අවබෝධාත්මක ව සියලු බාධක මතින් ඉදිරියට යන්නට, අලුත් දේ දකින්නට, අලුත් දේ කරන්නට, නිර්මාණශීලි හැකියාවන් ඔස්සේ දරුවන් තුළ ඉහළ පෞරුෂීය මට්ටමක් යහපත් සිරිත් විරිත් රකින ආගමානුකූල දරුවන්

පිරිසක් සකසන්නට පෞරුෂවත් නොපසුබට හිතක් මා තුළ සකසන්නට ඒ සඳුදා දින සවස අරඹන මනෝවිද්‍යානුකූල ඉගැන්වීම් මාලාව සතිය පුරා තුටින් සිටින්නටත් ඒ සතුට අන් අයට බෙදා දෙන්නටත් මට පිටුවහලක් වූ බව සඳහන් කරමි.

ගුරුවරියක ලෙසත්, මවක ලෙසත් මට බෙහෙවින්ම වැදගත් ලෙස හැඟුණේ දරුවන් හදාවඩා ගැනීමේ ආකාරය (Parenting) ඇබ්බැහිවීම, දරුවන් හඳුනාගැනීම, දරුවන්ගේ විවිධ පෞරුෂීය රටාවන් අධ්‍යයනය, දරුවන්ගේ ගැටලුවලට හොඳින් ඇහුම්කන් දීම, එක් එක් දරුවාට සුවිශේෂී වූ ක්‍රමවලට ගැටලු විසඳා ගැනීමට උදව් කිරීම ඔවුන්ට විවිධ උපස්ථම්භන පිරිනැමීම, ඔවුන්ගේ බුද්ධියටත් හදවතටත් ආමන්ත්‍රණය කිරීම රාජකාරි ජීවිතයේ මුහුණ දෙන ගැටලුවලට සාර්ථක විසඳුම් සෙවීම, විසඳුම් සෙවීමට උත්සහ කිරීමටවත් නුසුදුසු සාමාන්‍ය එදිනෙදා ගැටලු යන්නට දී බලා සිටීම නොව ඒවාට නවතින්නට කියා අප ඉදිරියට ගමන් කළ යුතු බවත් උගෙන, දරුවන්ගේ හදවත් තුළ සැමදා ජීවමාන වන ගුරු චරිතයක් ලෙස ආදර්ශමත් ව හැසිරීම වැනි මා තුළ වගා දිගා කරගත් යහපත් ගුණාංග ඉදිරියටත් වැඩි දියුණු කොට පවත්වාගෙන යාමට නැවත නැවතත් මනෝවිද්‍යානුකූල මතවාද අධ්‍යාපන කටයුතුවලට කෙසේ බලපාන්නේ දැයි පර්යේෂණාත්මක කටයුතුවල නියැලීමට පවා මා හට නැවතත් අවකාශ ලැබෙනුයේ ඉතිහාසය නැවත ක්‍රියාත්මක වීම වර්තමානය බව පසක් කරමිනි.

මෙහිදී තරහව, කෝපය, වේදනාව සැපදුක, හාස්‍යය, පිළිකුල්බව, වෛරය යනාදී සාමාන්‍ය මානුෂීය චෛතසික ස්වභාවයන් වරදක් නොව ඒවා පාලනය කිරීමටත් බාහිර පරිසරයට මුදා හැරීමටත් අප ගන්නා ක්‍රියාමාර්ගවල වැරදි ස්වභාවය නිසාවෙන් අප තුළ මානසික

ගැටලු ඇති වන බවත් ඒවා කාලාන්තරයක් තිස්සේ මනස තුළ වර්ධනය වීමෙන් ඉතාමත් අනිටු ප්‍රතිවිපාක විවිධ ලෙඩ රෝග වැළඳීමෙන් අප හට ජීවිතය පවා ඉක්මනින් අහිමි විය හැකි බවට හේතු සාධක සහිතව සනාථ කරන්නට මෙහිදී ඇසූ දේශන පාඩම් හේතු විය. අනන්ත ජාති සංසාරයේ පිරූ පෙරුමන්වලට ලැබුණා වූ මේ වටිනා මිනිස් කය ලෞකික සැප විහරණයට පමණක් නොව උන්මන්තක වූ සියලු මිනිස් ලොවෙහි හිත සුව පිණිස යහපත් ලෙස යොදා ගන්නටත් කළ යුතු හොඳ ම දෙය තමා සංවර වී පිළිවෙත්හී පිහිටමින් නීරෝගී සිතක් කයක් වචනයක් පවත්වාගෙන යාම බවත් මම මෙහිදී අවබෝධ කොටගෙන ඒ අනුව ක්‍රියාත්මක වීමි. සමාජයට ආදර්ශයක් වන ලෙස මාගේ පිළිවෙත් වගා දිගා කරගන්නා විට මාගෙන් උගත් දරුවන්, දෙමාපියන්, වැඩිහිටියන් ප්‍රමුඛ බාහිර සමාජය, මාගේ රැකියා ස්ථානයේ යහළු යෙහෙළියන් මෙන්ම සතා සිව්පාවන් පවා මෙත් සිතින් මා වෙත ආකර්ෂණය වීමේ වේගය වැඩිවන බව මට දැනුණි. කරන කාර්යය වඩාත් හොඳින් සියලු දෙනාගේ උදව් උපකාර ආශිර්වාද සහිතව නිම කිරීමට එකිනෙකා ගැන මා සිතන ආකාරයේ ඇති වූ සුබදායී වෙනස හේතුවක් වන්නට ඇති බව මට සිතෙයි. අලුත් නිර්මාණයක්, නව සංකල්පයක් ඉදිරිපත් කරනා විට වඩා වැඩි පිරිසක් මා සමඟ මේ වන විට එක් වන බව මට දැනෙමින් පවතියි.

විශේෂයෙන් ම පාසලේ වාර්ෂික විවිධ ප්‍රසංගවල දී මාගේ පන්තිවල දරුවන් ඇසුරින් නිම වූ නිර්මාණයන් ප්‍රධාන ආරාධිත අමුත්තන්, විදුහල්පතිතුමිය ඇතුළු නරඹන්නන්ගේ සුබ පැතුම් මැදින් සාර්ථක කරගන්නට මා හට ශක්තියක් වූයේ බාධක මැඩ ඒවා නොසලකා අරමුණු කරා මෙහෙයවන්නට තරම් සතිමත් හිතක් සකසාගන්නට ඉඩ සලසා දුන් සඳුදාවේ සමහන් සුවය නිසාවෙනි. එහිදී පුහුණුවීම් සඳහා කාලය, සුදුසු ස්ථානයක් කාර්යබහුල අවස්ථාවල

දෙමාපිය සහය ලබා ගැනීමට උත්සහ කිරීමේ දී ඇති වූ අනේක බාධක සිනහමුසු ව විඳ ගැනීමට මටත් මාගේ දියණිවරුන්ටත් හැකියාව ලැබීම පිටුපස ඔබෙන් මා ලද චිත්ත ශක්තිය මනා පිටුවහලක් වූ බව කියනු කැමැත්තෙමි. විශේෂයෙන් අඟහරුවාදා උදෑසන මා විසින් සඳුදා සවස ඔබ නිවහනේ ඇසූ යම් යම් කාරණා රසබර ව කියනා තෙක් මාගේ දියණියන් ඉතාමත් ආසාවන් බලා සිටිනා බව මට දැනුණි. පාඨමාලාවේ දී කියා දුන් මානසික ව්‍යායාම් සුදුසු පරිදි ගලපා (අයිස් කැටයක් මෙන් රඟපාන්න/මුහුදු පැළෑටියක් මෙන් හැසිරෙන්න/සංගීතමය ආකාරයට දියණිවරුන්ට ලබාදුන් විනාඩි කිහිපය ඔවුන්ට ඉතා සතුටක් සහ අස්වැසිල්ලක් වූ බව පුංචි කටහඬින් විවිධ අවස්ථාවල මතක් කරන විට දෙමාපියන්ගේ ඇමතුම්වලින් ප්‍රශංසා ලැබෙන විට සියුම් සතුටක් මා තුළ ඇති වූ බව කිව යුතුය. දරුවන් රිදවන දරුවන්ගේ ජීවිත සියුම් ව විනාශ මුඛයට ඇද දමන වේවැලෙන් මිදී ආදරයෙන් සෙනෙහසින් දරුවන් සුවපත් කිරීමට මා දරණ වෑයමත් ගුරු දිවියේ පසුගිය කාලය තුළ මා අත්විඳි සහ මා යොදාගත් ක්‍රම ශිල්ප ඉතා සාධාරණ බැව් දේශනවලට සවන් දෙද්දී මා තුළ මා ගැනම ආත්ම අභිමානයක් ජනිත කරලීමටත් සමත් වූ බවත් කිව යුතුය. පාසල් පරිසරයට පරිසර හිතකාමී දරුවන් පිරිසක් බිහි කිරීමට මාගේ පන්ති කාමර පරිසරය තුළත් පාසල් පරිශ්‍රය තුළත් මා සහ මාගේ දරුවන් විසින් සිදු කළ ව්‍යාපෘති කණ්ඩායම් වැඩ ප්‍රශංසාවට ලක් විය. මේ අභිමානය නැවත මා හට ලැබුණේ තැන්පත් මනසින් දරුවන් දෙස බලන්ට මා තුළ ඇති වූ ශක්තිය නිසාය. පාසලේ බොහෝ ක්‍රියාකාරකම්වල  දී මාගේ දියණියන් සාමකාමී ආදර්ශවත් ලෙස හැසිරීමටත් පන්ති කාමරය මනා ලෙස ඵලදායිතා සංකල්පය අනුව යමින් පිරිසිදුවත් ක්‍රමානුකූලවත් පවත්වාගෙන යාමට මාගේ පෞරුෂය මෙහෙයවීමට මට සිතුවිලි පහළ වීමට සඳුදා දවස මා ගත කළ ඵලදායි කාලය ප්‍රයෝජනවත් වූ බව කිව හැකිය.

උපදේශකවරයෙකුගේ කාර්යභාරය මනා ලෙස හඳුනාගන්නටත් මාගේ අන් අයට සවන් දීමේ හැකියාව තව දුරටත් වගා දිගා කරන්නටත් කණ්ඩායම් උපදේශන සැසි (Group Counselling, Couple therapy, Outside work shop) වලදී පැවැත් වූ උපදේශන පුහුණු සැසි මනා පිටුවහලක් වූ අතර, නිවසේදීත් පාසලේදීත් මෙකී අවධානයෙන් සවන්දීමේ මා තුළ ඇති වූ පුහුණුව ප්‍රයෝජනවත් විය. විශේෂයෙන් therapy හරහා අපගේ මනස නිදහස් කරලීමටත් සැහැල්ලු කරලීමටත් ගත් උත්සහය අගය කළ යුතුය. ගුරුවරියක ලෙස අප අන් අයගේ ශරීර භාෂාව (Body Language) තේරුම් ගැනීම අත්‍යවශ්‍ය අංගයකි. දරුවන් වැඩිහිටියන් දෙමාපියන් මෙන්ම බාහිර සමාජය අපට දක්වන දේ ඉතා මැනවින් තේරුම් ගැනීමට මෙම ඉගැන්වීම් ප්‍රයෝජනවත් විය. එක් එක් පුද්ගලයා සමඟින් එක් එක් අවස්ථාවලත් මා හැසිරීමේ දී මාගේ ශරීර අංග භාවිතා කළයුතු ආකාරය ගැන මා පුහුණුවක් ලැබීමි. එකිනෙකාගේ චිත්ත අභ්‍යන්තරය හඳුනාගැනීමට බාහිර අවයව වලින් ඔහු හෝ අප දක්වන චලන උපකාරී වන අන්දම පුදුමාකාර බව මට දැනුණි.

කුඩාවුන් ඇසුරේ දී ඔවුන් කුඩා කළ සිට පුරුදු පුහුණු වන දේ ඇබ්බැහිවීම් ලෙස අනාගතයේ ක්‍රියාත්මක වන බව මෙහිදී උගත්තෙමි. සැබැවින්ම මාගේ කුඩා පුතණුවන්ට ද මාගෙන් උගන්නා දියණිවරුන්ට ද අවශ්‍ය අවස්ථාවල උදව් ඉල්ලන වැඩිහිටි පිරිසට ද යහපත් දේ ඇබ්බැහිවීම් ලෙස පවත්වා ගැනීමට මෙහෙයවීම් සිදු කළෙමි. මා රූපවාහිනිය නරඹන්නේ නැති බවත්, මාගේ පුතණුවන් ද එය නොකරන නිසා ඔහු සාමකාමී දරුවකු වී ඇති බව ආදර්ශය කරමින් දියණිවරුන්ගේ රූපවාහිනිය බැලීමේ ඇබ්බැහිවීම් පාලනය කිරීමට මෙන්ම දියණිවරුන්ගේ පියවරුන්ගේ මධ්‍යසාර ඇබ්බැහිවීම්

දියණිවරුන් හරහා පණිවිඩයක් ලෙස ගෙන ගොස් ගුරු දෙගුරු හමුවලදීත් මේ ගැන කතා කර එම ඇබ්බැහිවීම් වලින් වලක්වා ගැනීමට උත්සහ ගත්තෙමි. සමහර දරුවන් පාසලට එන විට මැලවී ගිය මුහුණින් සිටිනු ද ක්‍රීඩාවල ක්‍රියාකාරීව නොයෙදෙනු ද කල්පනාකාරී ලෙස හැසිරෙනු දකින මා ඒ පිළිබඳ සොයා බලද්දී පියාගේ බීමත්කම, දෙමාපියන්ගේ සැර වැර, ඔවුන්ගේ කාර්ය බහුලත්වය තුළ දරුවන් තනිවීම ඔවුන්ගේ අනාරක්ෂිත බව වහා හැඳින දෙමාපියන් මෙකී ගැටලුව නිරාකරණය කරගන්නේ කෙසේ දැයි වෙන් වෙන් වශයෙන් අදාළ දෙමාපියන් දැනුවත් කිරීමටත්, ඉන් වැලකීමට යහපත් යෝජනා ගෙන ඒමටත් මා උගත් අතර ඒවා ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රශංසා ලැබීමි.

බොහෝ අයගේ අසාමාන්‍ය ගති ලක්ෂණ හඳුනාගනිමින් දරුවන් එකිනෙකාට විවිධ බව තවදුරටත් විද්‍යාත්මකව පැහැදිළි කිරීමටත් ළමා සංවර්ධන අවධි, ළමා උපදේශන සැසි වලින් ඒ පිළිබඳව මනා පුහුණුවක් ලැබීමට මට මින් අවස්ථාවක් උදා විය.

විශේෂයෙන්ම අධ්‍යාපන කටයුතු වල දී Naughty Kids ''නරක ළමයි'' යනුවෙන් කොටසක් නොමැති බවත් වචනයේ පරිසමාප්ත අරුතින්ම අපි ඔවුන් හඳුනාගන්නා මානයන් තුළ දරුවන්ගේ යහපත් අයහපත් ලක්ෂණ ඉස්මතු වීමට ඉඩ සැලසෙන බව මා හඳුනාගන්නට උත්සහ කරන ලදී.

එසේම ආතතිය කළමනාකරණය (Stress Management) කිරීමට මට පෙර දී තනිවම බොහෝ වෙහෙසක් ගන්නට සිදුවිය. එහෙත් අද එය ඉතා පහසු කාර්යයක් වී ඇත. හැඟීමේ සීමා සිතීමේ සීමා

හඳුනාගෙන කටයුතු කරන්නටත් ජීවන පුරුදු සමබරව පවත්වා ගන්නටත් මා උගත්තෙමි. තරහව පාලනය කිරීමටත් එය ඉවත දැමීමටත් මා මෙහිදී පුහුණු කරනු ලැබීමි. කවුරුන් හෝ තමා නොකළ වරදකට චෝදනාවක් කරන විට ඒවා සම සිතින් ඉවසීමට පුහුණු වීමටත් එදිනෙදා පෞද්ගලික ජීවිතයේ දී විඳින විවිධ තත්ත්වයන්ට හොඳින් මුහුණ දීමටත් මා පුරුදු වීම නිවසේ දී සැමියාගේ ප්‍රශංසාවට ලක් වීමට මා හට හැකි විය. මාගේ පුතුගේ දඟකාර ක්‍රියා මවක් ලෙස ඉවසන්නටත් ඔහු හොඳින් සමාජගත කරන්නටත් මෙහිදී ඉගැන්වූ (Parenting) දෙමාපියකරණය මනා පිටුවහලක් වූ බව කිව යුතුය. එසේම මිතුරු සබඳතා (Relationships) සමවයස් කණ්ඩායම් සමඟ ඵලදායීව කටයුතු කිරීමට මා ලද අභ්‍යාස ඉතා ඵලදායී විය.

වෙසෙසින්ම පාසලේ කාර්ය මණ්ඩලය සමඟ සුබදායී සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමටත්, එදිනෙදා හමුවන විවිධ පුද්ගලයින් සමඟ ධනාත්මක සබැඳියාවක් වගා දිගා කරගැනීමට මාගේ හැසිරීමේ හා වාග් විලාශයේ ඇති වූ යහපත් වෙනස තව දුරටත් හේතු විය. දැන් මා එදිනෙදා ඇතිවන කුඩා ප්‍රශ්න ගැන සිතමින් පෙර මෙන් ආතතියට පත් නොවෙමි. ජීවන පුරුදු ලෙස ඉතා ඉවසීමෙන් පුරුදු පුහුණු කරගත් යහපත් මානසික සිතුවිලි සුදුසු අවස්ථාවල පමණක් යොදා ගන්නට දැන් මට පුළුවන. පෙරදී සියල්ලන්ගේම ගැටලු මාගේ කරගනිමින් බොහෝ ගැටලුවලට විසඳුම් සෙවීමට ඔවුනට උදව් කිරීමට ගොස් සිත් රිදවා ගත් වාර අනන්ත විය. දැන් මාගෙන් උදව් ඉල්ලා සිටින අයගේ මට විසඳිය හැකි ගැටලු පමණක් තෝරා බේරා ගෙන සුදුසු පරිදි උපකාර කිරීමට පුරුදු වීම මාගේ මානසික සහනයට හේතු වී ඇත.

එසේම ප්‍රශ්න නිරාකරණය කර ගැනීමේ නොහැකියාව මත විශේෂයෙන් තරුණ පරපුර විසින් සිදු කරගන්නා සියදිවි නසා ගැනීම් හා ඒවාට හේතු, වළක්වා ගන්නා ක්‍රම, උපදේශනය ඒ සම්බන්ධව යොදා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ මා හට නිවහනේ දි පුහුණුවක් ලැබුණි. ඒ අනුව යමින් මනා අධ්‍යනයක් කළමට හිත රිදවාගෙන දුක් වෙමින් සිටින කුඩා දරුවන්ට හා වැඩිහිටියන්ට මානසික සහනයක් ලබා දීමට උත්සාහ කිරීමට හැකි විය. ගුරුවරියකගේ උපදේශන භූමිකාව මැනවින් පුහුණු වීමට මට මෙහිදී අවස්ථාව ලැබුණි. අදටත් දරුවන්ගේ විවිධ ගැටලු රැගෙන මා වෙත පැමිණෙන දෙමාපියන්ටත් යහළු යෙහෙළියන්ගේ විවිධ අපහසුතාවලටත් මැනවින් සවන් දෙමින් ගැටලු නිරාකරණය කරගැනීම සඳහා අස්වැසිල්ලක් වීමට මට හැකිව තිබේ.

බොහෝ විට මාගෙන් උගන්නා දරුවන්ගේ දෙමාපියන් මා සමඟ මිත්‍රශීලි ගෞරවාන්විත සම්බන්ධයක් පවත්වා ගන්නා නිසා ඔවුන්ගේ අනෙක් දරුවන්ගේත් යම් යම් ගැටලු මා සමඟ පවසයි. සමහර තරුණ දියණියන් පාසල් වයසේ විවිධ නොගැළපෙන චර්යා සහිතව කටයුතු කරන විට ඔවුනට අවවාද කරන්නට යැයි මාගෙන් ඉල්ලා සිටියි. බොහෝ විට පාසල් කාලයට නොගැළපෙන මිතුරු ඇසුර, ජංගම දුරකථනයට, පරිගණකයට ඇබ්බැහිවීම්, විවිධ අපයෝජන අනාවරණය වීම් පවා මා සමඟ කියන්නට සමහර විට ඔවුන් පෙළඹෙන අවස්ථා සිදුවිය. එම අවස්ථාවල සුදුසු ම දේ කිරීමට දෙමාපියන් යොමු කිරීමටත්, මනෝ වෛද්‍යවරුන් හා උපදේශකවරුන් වෙත යොමු කිරීමටත් මා හට උත්සහ ගත හැකි විය. මට හැඟුණේ පෙර වසර හත අටකට පෙර, මුලින් වැඩ කල පාසලේ උපදේශන පහසුකාරකවරිය ලෙස කැනේඩියානු රතු කුරුස සමාජයත්, අධ්‍යාපන අමාත්‍යාංශයත් ඒකාබද්ධව දකුණු පළාතේ ක්‍රියාත්මක කළ ‘‘අපි

සුරැකෙමු'' පාසල් දරුවන්ගේ සුරක්ෂිතභාවය වෙනුවෙන් සිදු කළ දැවැන්ත මෙහෙයුමේ එක් ක්‍රියාකාරී සාමාජිකාවක වූ මට දරුවන්ට අස්වැසිල්ලක් වෙමින් ගුරු ජීවිතයේ බොහෝ පින් රැස් කරගන්නට අවස්ථාව ලැබුණි. ගුරු වෘත්තිය වෙනුවෙන් කළ කැපකිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2012 සමස්ථ ලංකා ගුරු ඇගයීම් උළෙලේ ගුරු ප්‍රතිභා ප්‍රභා ප්‍රණාම සම්මානය ඇතුළු සම්මාන රාශියකට හිමිකම් කියන්නට හැකිවීම සතුටට කරුණකි. මෙහි පැමිණ කාලයක් යන තෙක්ම නිහඬව බලා සිටි මට දරුවන් වෙනුවෙන් අලුත් යමක් කරන්නට සිත් දුන්නේ ඔබ පාඨමාලාවට සම්බන්ධ වීමෙන් අනතුරුවයි.

පවුල් පරිසරය තුළ ඇරඹෙන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය නිසා විවාහක කාන්තාවන්, පුරුෂයන් මෙන් ම ඔවුන්ගේ දරුවන් ද මහත් පීඩාවක් විඳින බව ඔබ පාඨමාලාවේ දී තව දුරටත් උගත්තෙමි. අවබෝධයක් ලැබුවෙමි. පන්ති රැස්වීම් වලදී, දෙමාපියන් හා සාකච්ඡා වලදී මෙකී කාරණය ඉස්මතු කිරීමටත් පවුලේ ඉලක්ක සපුරා ගැනීමට කළයුතු කාර්යය ගැන ඔවුන් දැනුවත් කිරීමටත් මට අවස්ථාව ලැබුණි. රෝගීව සිටින දරුවන්ගේ දෙමාපියන් වෙනුවෙන් පිරිත් ගායනා කිරීමටත් ඔවුන් වෙනුවෙන් නිරෝගී වන ලෙස ඉල්ලමින් ආශිර්වාදාත්මක ලිපි යැවීමත් මාගේ දියණිවරුන් විසින් සිදු කරන ලදහ. ඒ අනුව යමින් සොසේජස්/ කුකුල් මස්/ සීනි අධික පැණි බීම වර්ග/ නූඩ්ල්ස් වර්ග සහ කෘත්‍රිම රසකාරක යෙදූ කෑම බීම වර්ග විශේෂයෙන්ම විෂ යෙදූ පලතුරු වර්ග භාවිතය අවම කිරීමට මා විසින් දරුවන් දැනුවත් කරන ලදී. සෞඛ්‍යයමත් ජීවිතයක් සඳහා කළ යුතු යහපත් පුරුදු සම්බන්ධව පාඨමාලාවේ කළ දේශනය මීට හේතු විය. අද වන විට මාගේ දියණිවරුන් වැඩි පිරිසක් ඉහත කී අනාරක්ෂිත, ශරීරයට හානි කරන ආහාර පාන වලින් වැලකී තම දෙමාපියන්, වැඩිහිටියන් ද දැනුවත් කරන අවස්ථා ගැන ඔවුන්ගේ දෙමව්පියෝ

කෘතඥපූර්වකව මා හට මතක් කර සිටිති. ගෙවත්තේ වගා කර ගත් එළවළු, පළතුරු වලට හුරු විය යුතු නිසා වෙන් පාසල තුළත් නිවෙස් වලත් ගෙවතු වගා කිරීමට දරුවන් තුළ ඇති වු උනන්දුව අගය කළ යුතු ය.

විශේෂයෙන් ම අධි ක්‍රියාකාරි දරුවන්ගේ ලක්ෂණ විස්තරාත්මක ප්‍රවේශයකින් වටහා ගැනීමට මින් හැකිවීම තුළ මාගේ ගුරු දිවියේ හමුවන එවැනි දරුවන් පහසුවෙන් හඳුනාගැනීමටත් ඔවුන්ට දයාවෙන් නිසි මඟ පෙන්වීමටත් දෙමාපියන් දැනුවත් කිරීමේ අවස්ථා කිහිපයක් මට ලැබුණි. මාගේ පන්ති කාමරයේ සිටින විශේෂ අවශ්‍යතා ඇති දියණිවරුන් කිහිප දෙනෙකු හඳුනා ගැනීමටත් ඔවුන්ගේ අවශ්‍යතා තේරුම් ගෙන නිසි මඟ පෙන්වීම් කිරීමටත් මා හට අවකාශය ලැබුණි. කාර්යබහුල දෙමාපියන් විසින් දරුවන් මත පටවන අනවශ්‍ය පීඩනය හේතුවෙන් පාසල් ඒමට මැලි වූ දියණියන් දෙදෙනෙකු යළි සතුටින් පාසල කරා ඒමට උනන්දු කිරීමට අවශ්‍ය කාර්යමූල පර්යේෂණ සැලසුම් කරමින් ගත් ක්‍රියාමාර්ග තුළ එම දියණිවරුන් දෙදෙනා අද වන විට ඉතා උනන්දුවෙන් පාසලට පැමිණීමත් අධ්‍යාපන කටයුතු වල නියැලීමත් දක්නට ලැබිණි.

මාගේ පවුල එනම්, සැමියාත් කුඩා පුතණුවනුත් මාත් අතර ඉතා සංවර්ධනාත්මක භූමිකාවක් පසුගිය කාලයේ මා විසින් සිදු කළ බව මාගේ සැමියා නිතර පවසයි. සියලු දෛනික ක්‍රියාකාරකම් මනා සැලසුමකින් යුතුව නිම කිරීමටත් ඉතා සංයමයෙන් යුතුව විවිධ කාරණා කෙරෙහි සිත යොමු කරන බවත් එය පවුලේ සතුට පැතිරීමට හේතුවක් වී ඇති බවත් ඔහු පවසයි. සඳුදාවේ සැසියට සහභාගී වීමට මාගේ උනන්දුව නිසාම අත්උදව්කාරිය නොපැමිණෙන සමහර සඳුදා දිනවල ඔහු රැකියාවෙන් නිවාඩුවක් ලබා ගෙන මා හට පාඨමාලාවට

සහභාගී වීමට අවස්ථාව ලබා දෙන අවස්ථාවල ඔහු මා හට පැවසුවේ මා සතුටින් සහභාගී වන එම වැඩමුළුවෙන් තමාටත් දරුවාටත් සුබදායී වටපිටාවක් තව දුරටත් නිර්මාණය වන බව ඔහු දන්නා නිසා එසේ කරන බවකි. සැබෑවකි. පසුගිය සමස තුළ මාගේ ආදරණීය පුතණුවන්ගේ චර්යාත්මක වෙනසක් දක්නට ලැබුණු බව මට ද පෙනී ගිය අතර දෙමාපියන් ලෙස අපි දරුවන් හදා වඩා ගන්නා යහපත් ක්‍රම ගැන මා ලද උගැන්වීම් ඊට පිටුවහලක් වී ඇති බව කිව යුතු ය. ඔවුන්ගේ සෙනෙහස වෙනදාටත් වඩා තදින් දැන් මට දැනේ. කිසිවක් නොඉල්ලා ම මා සතුටු කරන ඔවුන් වෙනුවෙන් මට කළ නොහැකි කැප කිරීමක් නොමැති යැයි සිතෙන තරමට අප කුඩා පවුලේ බැඳීම් ශක්තිමත් වී ඇත. ජීවන පුරුද්දක් ලෙස මත්පැන් පානය නොකිරීමත් නරක මිතුරන් ඇසුරු නොකිරීමත් සුබදායී ලෙස ජීවිතය දෙස බැලීමත් ඔහු උගත්තේ සමාජයේ හැසිරීමෙන් ලත් අත්දැකීම් මත බව කියා ඔහු මා මෙම පාඨමාලාවෙන් න්‍යායාත්මක හා ප්‍රායෝගිකව ලද අත්දැකීම් සමාජය මත ගලපා බලන්නට යැයි මට කිය යි. සඳුදාවේ මා ලබන අත්දැකීම් එදින සවස ඔහු හා හුවමාරු කරගන්නා විට මා කියන දේ ඔහු ද ගැඹුරින් සිතයි. මට එය මහත් සතුටකි. විශේෂයෙන් ම මාගේ ජීවිතය බඳු වූ මාගේ රැකියාවේ කටයුතු වලට ඔහු දෙන සහයෝගය පසුගිය කාලයේ වැඩිවීමටත් මාගේ රැකියාවත් ගෘහ ජීවිතයත් සමබරව පවත්වා ගැනීමට මා ලද පුහුණුව හේතු වන්නට ඇතැයි මට දැනෙයි.

ඉතා සතුටුදායක එක් දින වැඩමුළු දෙකකට සහභාගී වී කණ්ඩායම අතර සුහදතාවය වර්ධනය කර ගැනීමට අපට ලැබුණු අවස්ථාවන් ද ඉතා තීරණාත්මක දිනයක් විය. දමා යාමට වේදනාකාරී වන යහපත් මිනිස් කණ්ඩායමක් කලකට පසුව හමු වූ නිවහනේ ගත කළ සය මස ඉතා ඵලදායීව මා ගත කළ බව මට හැඟෙයි.

දයාබර ''නිවහන'' නිවහනේ දී අප හට මඟ හසර කියා දුන් ඇදුරු මඩුල්ලත් පාඨමාලාව සම්බන්ධීකරණය කළ මහත්ම මහත්මීනුත් සුහදශීලි බවත් ඔවුන් විසින් අප හට තනා දුන් සුබදායී වටපිටාවක් සමහන් සිතක් ඇති කර ගන්නට මා හට මනා පිටුවහලක් වූ බව කිව යුතුමයි. වෙසෙසින් ම දිගු නිහැඬියාවකට පසු මට, මට ම සතුටු විය හැකි මට අවැසි මා, අවදි කිරීමටත්, යහපත ම පතන සිත්වලට කළ හැකි බොහෝ යහපත් කාර්යයන් ඇති බවත් පසක් කරමින් මා සිත සතිමත් කළ ඔබ වෙනුවෙන්, මාගේ අවදි වූ ධනාත්මක සිතුවිලි වලින්, තවත් වසර ගණනාවක් ලොව දකින දරුවන්ගේ මතකයනුත්, දිවි මගේ හමුවන මාගෙන් ආශිර්වාද ලබන සියලු සිත්වලත් බලයත් කැටි කොට, චිරාත් කාලයක් තව තවත් සරු ව වැඩෙන්නට, නිවහන සමාජයටත් එහි විසල් රුක් මෙන් සෙවන දෙන අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයටත් නිවහනට ගොඩවදින සියලු සිත්වලටත් සුභාසිංශන පිරිනමමි.

# වර්තමානයට

# 2023.11.11

ඔබ කියවූ උක්ත සටහන නිමවා දැනට වසර 04 ක් පමණ ගත වී ඇත. නව වසරක් වූ මෙ නුවර ගෙවුණු කාලය පුරාවට ම ගුරුතුමියක ලෙස, දූවරුන්ගේ මවක ලෙස, මහාමායා දූවරුන් කෙරෙහි දැක්වූ ආදරණීය සෙනෙහසට බොහෝ රසවත් මතක පිරෙයි.

අද වත් දී පාසලේ සතුටින් ම දැරියන් පිරිස තමන් බව කියමින් ඔවුහු උදම් අණති. පාසලේ සතුටින් ම සිටින ගුරුතුමියන් අතර මම ද එක් අයෙක්මි. මගේ සතුට නිරතුරුව මා අසල සෙනෙහසින් රැඳෙන ආදරණීය දූවරුන්ගේ සිනහවන් ය. දරුවන් තරම් වැඩිහිටි හිත් කියවන්නට දන්නා වෙනත් කවුරුන් හෝ නොමැත. මා විසින් තනා ගෙනෙනා රසම රස බත් පතින් කවා ඔවුනට අනා කවද්දීත් විටෙක ඔවුන් ගෙනෙනා බත් පතින් කටක් අනා මට කවද්දීත් එක ලෙසම දැනෙන්නේ එකිනෙකා අතර ඇති බැඳීමයි.

පාසලේදී යම් සුලු අසනීපයක් වැළඳී හෝ වෙහෙසින් සිටිනා විට ළඟ දැවටෙමින් සාත්තු සමාත්තු කරද්දී මටම දුවණියන් ලැබුණා සේ මට දැනෙයි.

දරුවන් අනාගත තාක්ෂණික වැඩ ලෝකයට ගැලපෙන ලෙස පුහුණු කරමින් ඔවුන් සතු සියලු බහුවිධ බුද්ධීන් ප්‍රායෝගිකව අත්හදා බලන්නට දරුවන්ට අවස්ථාවන් නිර්මාණය කරන්නට මා ගත් වෙහෙස අපමණ ය. 2023 Mayans Expo අධ්‍යාපන හා වෙළඳ ප්‍රදර්ශනයේදී මගේ දියණිවරුන් විසින් නිම වූ නව නිපයුම් 15 ක් සඳහා ආරාධනා අමුත්තන්ගේ මනා ප්‍රශංසාවක් ලැබුණු මොහොත සිහි කරන්නේ සතුටිනි.

බොහෝ අභියෝග මැද හරි ම හරි දේ හරියට කරන්නට ඒ කුඩා සිත් තුළ බුද්ධියේත් සංවේදී භාවයේත් විවිධ මානයන් සොයා යන්නට සාධාරණ

උපක්‍රම මගින් සෘජු අත්දැකීම් ලබා දෙන්නට මා ගන්නා උත්සාහයන් ඔවුහු නිතර සමරති.

ගුරු දිවියෙහි 18 වසරක් පුරාවට හමු වූ සියළු දරුවන් කෙරෙහි සම සිතින් සිතන්නට ගත් උත්සාහයන් ගුරු වරියක ලෙස මා ලද වටිනාම සැමරුමයි. "දරුවා කාගේ ද නොව කාගේ වුව දරුවෙකි". ඒ සමානාත්මතාවය සිසු දරුවන් කෙරෙහි හදෙහි රැඳෙන උතුම් දයාවන් තුළ පිහිටා කටයුතු කරන විට සිතට දැනෙන අස්වැසිල්ල අති මහත්ය. 18 වසරකට ඉහතදී හමුවූ දරුවන්ට ද තවම මේ ගුරුතුමියගේ මතකය සුන්දර වී ඇත්තේ එහෙයිනි. ඔවුහු තවමත් නොවැම්බර් මස 11 වන දින මාගේ උපන් දිනය දා මධ්‍යම රාත්‍රී 12.00 ට සුභ පැතීමට අමතක නොකරති.

සැමදා උදෑසන විනාඩි 10 පමණ දවසේ කිසියම් හෝ ලැබූ අත්දැකීමක් රසකර පවසද්දී මුව අයාගෙන බලා සිටින දැරියෝ ඒ කතා වලින් බොහෝ ජීවිත ආදර්ශ ලබති. වාර සටහන්හි විෂය නිර්දේශයන්හි සැගව ඇති ජීවිතයේ ප්‍රායෝගික යථාර්ථයන් තෝරා, බේරා, පෙරා දරුවන්ට අත්දැකීම් ලෙස ලබා දීම ගුරුවරුන්ගේ යුතුකමයි. ඒ යුතුකමෙහි අධිෂ්ඨානයෙන් නියැලෙන ගුරුභවතුන් දරුවන්ගේ නොමද ප්‍රශංශාවට ලක් වේ. මා ද එවැන්නියකි.

දරුවන්ගේ ප්‍රාථමික පාසල් කාලයට මිහිරියාවක් එක් කරන්නට මට හැකි දෑ අපහසු දෑ පවා ආයාසයෙන් කිරීමට සිදුව තිබේ. සියල්ල අවසන ඔවුන්ගේ සිනහ පිරි මුහුණු දකින විට දැනෙන සතුට කියා නිම කළ නොහැකි ය. අධ්‍යාපන කටයුතු මෙන් ම විෂය සමගාමී ක්‍රීඩා හා විෂය බාහිර කටයුතු ද ජීවිතය දිනනට අත්‍යාවශ්‍ය උතුම් මානවීය ගුණාංග ද සමබරව උගත යුතු බවත් භාවිත කළ යුතු බවත් මම ඔවුනට ආදරයෙන් කියා දෙන්නෙමි. යළි දිනෙක ලොකු දැඩි වී සමාජයට තනිව පිවිසෙන දින ප්‍රාථමික පාසලේ දී මා ඇසුරේ උගත් බොහෝ සාරාර්ථ ප්‍රයෝජනවත් වී ඇති බව ඔවුන්ට සිහි වනු ඇත.

පාසලේ රාජකාරිමය කටයුතු ද, මා විසින් කරන විවිධ සමාජ සේවා කටයුතු ද අවුරුදු 07 ක පුතණුවකුගේ ආදරණීය මවක සහ මගේ සැමියාට ආදරණීය බිරිඳක ලෙස පෞද්ගලික ජීවිතයේ කටයුතු ද අද වන් දී සමබරව

කරගෙන යාමට මෙම පරිසරයේදී මා හට ලැබුණු විවිධ අභියෝග ජීවිත අත්දැකීම් මා හට පිටුවහලක් වී ඇත. ඒ සියලු අත්දැකීම් ලබන්නට හේතු වූ සියලු පරිසරාත්මක සහ මානවීම සාධක වලට මම ස්තූතිවන්ත වෙමි. අතීතය දෙස හැරී බලද්දී ඇති වන්නේ සතුටකි. දෙව්ලොව ගොස් සිටින මාගේ ආදරණීය මව ද පියා ද සියලු කල්හි මා දෙස බලා සිටිනා බව මට දැනෙයි. සියලු උවදුරු වලින් ඔවුන් මා ආරක්ෂා කරන බව මට හැගෙයි. ඔවුන් මා අසල ඇති බව මට දැනෙයි. අද මා සතුටිනි. මා ඇසුරේ සිටින සියල්ලෝම පාහේ සතුටිනි.


දිවි ගමනේ නේක අභියෝග මැදින් ගමන් කළ මගේ ජීවිත කථාවේ අතරතුර සිදුවූ සියල්ල දකින්නට "The Diary of Sensitive Teacher" "සංවේදී ගුරුවරියකගේ දිනපොත" කෘතිය ඔබ වෙත තිළිණ වන තෙක් බලා සිටින්න. සමහර විට එය ඔබේ කථාව ද විය හැකිය.

දළදා සමිඳු පිහිටයි
2023.11.11
මහනුවර දී



## මතක සුවඳ

**වසර අවසානයක දයාබර සිසු දියණිවරුන්ගෙන් ලද තුති පිදුමේ සතුට...**



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කුරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023-11-01